චාර්යවරයා ගේ මුහුණ දුටු වනම මදාරා විස්මයට පත් වූවා ය. මේ ඇය කිසි දිනෙක නැවත දකින්නට බලාපොරොත්තු නොවූ මිනිසෙකි. ජීවිතයෙන් සදහටම මකා දමනු ලැබ සිටින මිනිසෙකි.

"මදාරා... කොහොමද ඉතින්.?" ඔහුගේ කටහඬ අසාමාන්‍ය ලෙස රළු ය. මදාරා පිළිතුරක් නොදී බලා සිටියා ය. ඔහු

*ඔහේගෙ චරිත ඝාතනය කරන්නවත් ඔහේට චරිත සහතික දෙන්නවත් මට ඕනෙ කමක් නැහැ මිස්ටර් සූරියබණ්ඩාර.. කරනවා නම් ඒ වැඩේ මං තරම් හොඳට කරන්න දන්න කෙනෙකුත් මේ ලංකාවෙ නැහැ..*

පැමිණ සිටින්නේ තමාග් සුව දුක් දැනගෙන යන්නට නොවන බව ඇය දනියි.

"මිස්ටර් සූරියබණ්ඩාර මම ලොකු වැඩක ඉන්නෙ.. රාජකාරි වැඩක් නම් මිස්ටර් කුලසේකර හමුවෙන්න.. එයා ඉන්නෙ ඇතුළෙ කාමරේ.." මදාරා සිතේ මතුව එන කෝපය මැඩ ගන්නට තැත් කරමින් කීවා ය. ඔහු රළු ලෙස සිනාසුණෝ ය.

"මං ආවෙ මිස් මදාරා වෛද්‍යසේකර හමුවෙන්න.." ඔහු කීවේ ය. "..මේක රාජකාරි වැඩක් නෙවෙයි.. මට තියෙනවා ඔයා එක්ක පුද්ගලික කතාවක්.." එදා සේම අදත් ඔහුගේ වචන වල ඇත්තේ අධිපතිවාදී ස්වරයකි. එයට යටත් වීමේ අවශ්‍යතාවක් දැන් නැත.

"සමාවෙන්න.. මට ඔහේ එක්ක කතාවක් නැහැ.. මේක මගේ ඔෆිස් එක.. මෙතන මට පුද්ගලික කතා වල යෙදෙන්න විදිහක් නැහැ.. අනිත් කාරණේ මට ඔහේ එක්ක කතා කරන්න දෙයකුත් නැහැ.. කිසිම දෙයක් නැහැ.." මදාරා කෝපයෙන් ගිණිගත් දෑසින් යුතුව කීවා ය. "..කරුණාකරලා මෙතනින් යන්න.."

"ඔහේට කතාවක් නැති වුණාට මට කතාවක් තියෙනවා.." තිසර මේසය හරහා ඇදී විත් ඇගේ දෑස් දෙස බැලුවේ ය. ඔහු කෝපයෙන් වෙව්ලණු ඇය දුටුවා ය. "..ඔහේ අර චිත්‍රපටිකාරයා එක්ක එකතු වෙලා මට විරුද්ධව හදන්න ප්ලෑන් කරන ෆිල්ම් එක ගැන මං දන්නවා.. මට අපහාස කරන්න ලෑස්තිවෙන්න එපා මදාරා.. අපි අතරෙ යමක් වුණා නම් ඒ හැම දේම වුණේ තමුන්ගෙ කැමැත්තෙන්.."

"මගේ කැමැත්තෙන්..?" මදාරා ආවේගය පාලනය කරගන්නට උත්සාහ ගන්නා අතර ඇසුවා ය. "මට ඩ්‍රග්ස් දුන්නෙ මගේ කැමැත්තෙන් ද..? මාව අර නාකි ලෙක්චරර්ට බිලි දුන්නෙ මගේ කැමැත්තෙන් ද..?"

තිසර සූරියබණ්ඩාර හැරී දොර දෙස බැලුවේ කිසිවකු අසා සිටින්දැයි සැක හැර ගන්නටය. අනතුරුව ඔහු මදාරා ඇමතුවේ වඩාත් පහත් එහෙත් රළු හඬකිනි.

"ඒ ගනුදෙනුවට අපි තමුසෙට සාධාරණ මිලක් ගෙව්වා.. තමුසෙට ක්ලාස් එකක් ලැබුණෙ උගත් කමටම නොවන විත්තිය තමුසෙ දන්නවනෙ.. ඒ ගනුදෙනුව එතැනින් ඉවරයි.. මමවත් කුසල්ගොඩවත් ඒ ගැන කා එක්කවත් කිය කියා ඇවිද්දෙ නැහැනෙ.. තමුසෙට කරදර කර කර පස්සෙන් ආවෙත් නැහැනෙ.. අපි තමුසෙගෙන් බලාපොරොත්තුවුණොත් ඒ රහස්‍යභාවය රකින එක.. ඒ වෙනුවට දැන් තමුසෙ ට්‍රයි කරන්නෙ අපට මඩ ගහන්න ක්‍රමයක් හදාගන්නයි.."

මදාරා කෝපාග්නියෙන් දැල්වෙන දෑසින් ඔහු දෙස බලා සිටියා විනා වදනක් හෝ නොදෙඩුවා ය. ඔහු සිය දැඩි හඬින් දිගටම කතාකළේ ය.

"හිතන්න එපා මේක ලේසි වැඩක් වෙයි කියලා.. තමුසෙ මට අපහාසයක් වෙන යමක් කළොත් මං මේකට විරුද්ධව මුලු විශ්ව විද්‍යාල පද්ධතියම අවුස්සනවා.. මගේ චරිතයට අපහාස වෙන යමක් සිදුවුණොත් මං උඹලා ඔක්කොම විනාශ කරනවා.. ඒක කියල යන්නයි මං ආවෙ.." ඔහු අවසාන වාක්‍යය කීවේ පුටුවෙන් නැගිට ඇය දෙසට ඇඟිල්ල දිගු කරමින් ය.

මදාරා ද ඔහු අනුව නැගී සිටියා ය. ඇයට බියක් නොදැනුණි.

"ඔහේගෙ චරිත ඝාතනය කරන්නවත් ඔහේට චරිත සහතික දෙන්නවත් මට ඕනෙ කමක් නැහැ මිස්ටර් සූරියබණ්ඩාර.. කරනවා නම් ඒ වැඩේ මං තරම් හොඳට කරන්න දන්න කෙනෙකුත් මේ ලංකාවෙ නැහැ.. තමුසෙ නොදන්නවට තමුසෙ විනාශ කරපු මගේ ජීවිතේ මං ගොඩ ගත්තෙ අපා දුකක් විඳලා.. ඒ මූසල අතීතය ආයෙ ආයෙ සිහිපත් කරන්න මං කැමති නැහැ... මං උඹලගෙ තර්ජන වලට පොඩ්ඩක්වත් බය නැහැ.. කරුණාකරලා මට මගේ පාඩුවේ නිවී සැනසිල්ලෙ ජීවත් වෙන්න ඉඩ දෙනවා.." මදාරා කෑගැසුවා ය.







සමහරවිට ඒ කෑගැසීම කාමරයෙන් පිටතටත් ඇසෙන්නට ඇතැයි තිසර සූරියබණ්ඩාරට සිතුණි. තව දුරටත් මෙහි රැඳී සිටිය යුතු නැති බව ඔහු වහා වටහාගත්තේ ය.

කෝපයෙන් දැල්වෙන දෑසින් නැවත වතාවක් මදාරා දෙසට දබරැඟිල්ල දිගු කළ තිසර වහා කාමරයෙන් පිටව ගියේ ය.

***මතු සම්බන්ධයි***




# Bravery

*Be brave and don't hide*
*But stand on your own side*
*And when you fall*
*Get back up and stand tall*
*And when you face your fears*
*Wipe away those tears*
*And keep moving upwards*
*Because there is nowhere else to go than forwards*
*Being brave means you can get up*
*Even if you fall into a dump*
*Because your life is what you make of it*
*So gather up your courage and make the best of it.*

When I was little I thought that someone who was brave wouldn't be scared of anything, but over the years I have learned that this is not true. Being brave does not always mean that nothing scares you, but it means that even though something may scare you do not let it stand between you and what you want to succeed. You take everything as it is thrown at you and if you fall you get back up again and keep moving on, this is what I believe being brave means. You fight for your freedom to be heard and even though some people may disagree you speak of what you believe in. Someone brave realise that things may not always go smoothly but they don't let that stop them from living their lives.

I had this friend one who I thought was never scared of anything and I always that that she was just always brave and nothing would ever scare her. Really she was scared of lots of things but she never let that stop her, she faced every task without hesitation because she did not want fears to hold her back form anything. Being brave does not mean that you are not scared of anything; it means that you are ready to face your fears. It means that you will never let your fears stand in between yourself and your goals. Your fears don't control your life and you are ready to look past them when you need to. Instead of your fears being in control of you, you are in control of your fears.

Everyone believes in something different and if someone can stand up for what they believe in no matter what other people think then they are being brave. People like Martin Luther King and Rosa Parks who stood up for what they believed in changed the world for the better. All they had to have was a burst of bravery for a few seconds, a want to be heard and an idea that could change the world for the better. They risked their lives do that they could be heard and so that their voices would not be lost. Being brave is not only just facing your fears but it is also letting people hear you, from small things as sharing your ideas in class to sharing your ideas to the world. Don't let your voice be hushed.



Sometimes life may knock you down of your feet and in this situation you could decide to do either two things; stay on the ground and never get back up again or be brave and brush and get up brushing it off and moving forward in your life. Have you ever heard the saying "if life gives you lemons you make lemonade?" Well this saying just means if something does not go the way it was planned then you make something else of the situation, you learn from it helping you become a better person you keep moving on and do not look back at it, it is a part of your past and there in your past ids where you shall keep it.

Or you could decide to not leave the moment and get upset about a problem that you could have easily brushed off. Being brave means that you take life as it comes when you heat a rocky road you somehow get through it and get back to the smooth pathway, you never let your past hold you back form living your future.

Being brave is not just about taking risks but it is also about being able to move on, stand up and be heard. Yes everyone has something that scares them, but will you let your fears rule your life? When you are able to get over your fears when you need to is being brave. Have you spoken up lately? Or are you living in a shadow? Speak up and be heard because you voice is just as important as everyone else's.

Life is a rollercoaster with its highs and lows, once you are able to accept that with the lows the highs would not be that fun you are being brave and facing every moment on the ride as it comes. So bravery is not just all about being there to catch someone that is falling form a burning building but it is the way that you live your life.

සිංහලෙන් පැය දෙකක්
FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා

රංජිත් රූබි සමඟ පැය තුනක් විනෝදය සහ නැවුම් ගීත සමගින් සෑම ඉරිදාවකම රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

ලක් මිහිර
සිංහල ගුවන් විදුලිය
සෑම බ්‍රහස්පතින්දාම සවස 6 සිට 8 දක්වා
FM 88.6

FM 94.1
ලක් මිහිර South
අඟහරුවාදා රාත්‍රී
10 - 12 දක්වා
අසන්න - විඳින්න